# පොල් වගා කිරීමේ මණ්ඩලය - 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ගනුදෙනුවල නියැදි පරීක්ෂාවන්හිදී අනාවරණය වූ රු.300,365,413 ක ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් හා රු.82,806,449 ක ගිණුම්කරණ අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරණ ලදී. ඒ අනුව ගිණුම් වල එම අඩුපාඩු සම්බන්ධයෙන් ගැලපීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කරන ලදී. මේ අනුව නයැදියට පරිබාහිරව තවදුරටත් ගිණුම්කරණ අඩුපාඩු නොතිබේය යන්න බැහැර කළ නොහැක විණි.

(ආ) විවිධ ව්‍යාපෘති වෙතින් මණ්ඩලය වෙත ලැබී තිබූ හා මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරමින් පවතින වාහන 02 ක් අගය කොට ගිණුම් ගත කර නොතිබුණි.

### 1.2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

| <u>නීති, රීති හා රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) මූදල් රෙගුලාසි | |
| (I) මු.රෙ.104 (3) හා (4) | සමාලෝචිත වර්ෂය තුල සිදු ව වාහන අනතුරු 13 ක් සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය | මාස 06 කට වරක් ඉන්ධන පරිභෝජනය පරික්ෂා කළ යුතු වුවත් මණ්ඩලයේ වාහන 23ක ඉන්ධන පරිභෝජනය වර්ෂ 1 1/2 වැඩි කාලයක සිට පරික්ෂාකර නොතිබුණි. |

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, එකතුව රු: 639,767,700 ක් වූ රජයේ පුනරාවර්තන හා සෙස් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.186,511,249 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපිව ඉකුත් වර්ෂයේ එකතුව රු.662,597,042 ක් වූ රජයේ පුනරාවර්තන හා සෙස් ඇතුළු අනෙකුත් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු අතිරික්තය රු.169,219,772 ක් විය.

### 2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

#### 2.2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේදි මණ්ඩලයේ මුළු ආදායමින්, රජයේ ප්‍රදාන 80% ක් වූ අතර වෙනත් ආදායම් 20% විය. ඉකුත් වර්ෂයේදි රජයේ ප්‍රදාන හා වෙනත් ආදායම් පිළිවෙලින් 91% හා 9% ක් විය.

**(ආ)** සමාලෝචිත වර්ෂයේදි මණ්ඩලයේ මුළු පුනරාවර්තන වියදමින් සහනාධාර හා ව්‍යාප්ති සේවා සඳහා වූ වියදම 53% ක් වූ අතර මෙහෙයුම් වියදම 47% ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන් වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.95,888,041 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඒ හා සසඳන විට ඉකුත් වර්ෂයේ ඊට අනුරූපිව ශුද්ධ ලාභය රු.55,086,699 ක් විය. ඒ අනුව ලාභයේ වැඩිවීම රු.40,801,342 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පොහොර ඒකකය රු.2,172,797 ක ඌණතාවයක් ලබා තිබූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,899,933 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල කප්රුක ව්‍යාපෘතියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,209,457 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,022,521 විය.

### 2.2.2 කාරක ප්‍රග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ වැදගත් ගිණුම් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය |
|---|---|---|
| ජංගම අනුපාතය | 29 :1 | 7:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 19 :1 | 5:1 |

ආයතනයක සම්මත ජංගම අනුපාතය 2:1 අනුපාතයට හා ක්ෂණික වත්කම් අනුපාතය 1:1 අනුපාතයට පැවතිය යුතු වුවද මණ්ඩලයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය අසාමාන්‍ය බැවින් අරමුදල් කළමනාකරණයේදි ඥාණාන්විතව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල එක් එක් කාර්යයන්ගේ ඉලක්ක සහ සපරා ගැනීම් සාරාංශ කර පහත දැක්වේ.

### 3.1.1 සහනාධාර ගෙවීම්

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සහනාධාර ක්‍රම කිහිපයක් ක්‍රියාත්මකකර පවත්වාගෙන ගොස් තිබූ අතර, වර්ෂය අවසානයේදී සහනාධාර වැඩ සටහන් වල ඉලක්කය හා එහි ප්‍රගතිය පහත පරිදි විය.

(අ) <u>නව/නැවත/යටි වගා සහනාධාරය</u>

පොල් නව/නැවත/යටි වගාව යටතේ අක්කර 12,500 ක් වගා කිරීමට ඉලක්ක කර තිබුණත් මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව අක්කර 7,594 ක් වගා කර තිබුණි. ඒ අනුව, එහි භෞතික කාර්යසාධනය 61% ක් විය. ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල 09 ක 13% ත් 49% ත් අතර අවම මට්ටමක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබුණි.

"මෙම වැඩසටහන 2011 වසර පුරා ක්‍රියාත්මක වූවක් නොවේ. 2011 අප්‍රේල් මාසයේදී එම වැඩසටහන සංශෝධන සඳහා නතර කෙරුණු අතර, නැවත ආරම්භ වූයේ මාස කිහිපයකට පසුවය. එමනිසා අක්කර 12,500ක ඉලක්කය සපුරාලීමේ වැඩසටහන වසර පුරා ක්‍රියාත්මක නොවීය" යනුවෙන් සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ආ) <u>පුනරුත්ථාපන සහනාධාරය</u>

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී පොල් අක්කර 1,250 ක් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් රු .මිලියන 03 ක සහනාධාරයක් ලබාදීමට ඉලක්කර කර තිබුණි, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසන් වනවිට අක්කර 1,990 ක් සඳහා රු.මිලියන 11.5 ක සහනාධාර ලබා දී තිබුණි. එහි භෞතික කාර්යසාධනය 159% ක් විය. මේ සඳහා අවශ්‍ය වු රු. මිලියන 7.5 ක අතිරේක ප්‍රතිපාදන සපයාගෙන තිබුණේ පාංශු ජල සංරක්ෂණය හා වාරිමාර්ග ප්‍රවර්ධනය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන වලින් වන අතර එම වැඩසටහන යටතේ වූ ඉලක්ක කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ ළඟාකර ගෙන නොතිබුණි.

(ඇ) <u>කප්රුක පුරවර ගෙවතු වගා සහනාධාරය</u>

ගෙවතු වගා වැඩ සටහන යටතේ පොල් පැළ 133,900 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට පොල් පැළ 47,850 ක් බෙදා දී තිබුණි. එහි භෞතික කාර්යසාධනය 36% ක් විය. ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල 09 කාර්ය සාධනය 0% ක් ද ප්‍රාදේශීය කාර්යාල 04 ක 50% කට වඩා අඩු කාර්ය සාධනයක් ද පෙන්නුම් කර තිබුණි.

"ජාතික මට්ටමින් සංවිධානය වූ දිවිනැගුම වැඩසටහන හා මණ්ඩලයෙන් ක්‍රියාත්මක වූ කප්රුක පුරවර ගෙවතු වගා සහනාධාරය යන දෙකම ගෙවතු වගා වැඩසටහන්ය. දිවිනැගුම ගෙවතු වැඩසටහනට පැළ මිලියන 2 ක් හදිසියේ වෙන් කිරීමට අවශ්‍ය වූ බැවින් ප්‍රමුඛතාවය දිවිනැගුම වැඩසටහනට ලබා දුන් නිසා සමහර ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය සාධනය අඩු වූ බව" සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ඈ) <u>කප්රුකයි සිප්නැණයි වැඩ සටහන</u>

මෙම වැඩ සටහන යටතේ පොල් පැළ 300,000 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට පොල් පැළ 265,956 ක් බෙදා දී

තිබුණි. එහි භෞතික කාර්යසාධනය 89% ක් විය. ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී කළුතර ප්‍රාදේශීය කාර්යාලය 48% ක කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබුණි.

(ෞ) සම්බුද්ධත්ව ජයන්තිය වැඩ සටහන

මෙම වැඩ සටහන යටතේ පොල් පැළ 50,000 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට පොල් පැළ 31,943 ක් බෙදා දී තිබුණි. එහි භෞතික කාර්යසාධනය 64% ක් විය. ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල 03 ක කාර්ය සාධනය 8% ත් 42% අතර මට්ටමක පැවතුණි.

(ඵ) අතුරු භෝග වගා සහනාධාරය

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල නව සංවර්ධන වැඩ සටහන් යටතේ අතුරු භෝග වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් 15 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණ ද කිසිදු වැඩ සටහනක් පවත්වා නොතිබුණි. ඒ සඳහා වෙන්කර තිබූ මුදල් භාවිතා කර අතුරු භෝග වගා සහනාධාරය යටතේ ඉලක්කකර තිබූ අක්කර 20,000 කින් අක්කර 106 ක් සඳහා රු.813,505 ක සහනාධාර මුදලක් ලබාදී තිබුණි.

(ඌ) ගව ගාල් සහනාධාරය

නව වැඩසටහන යටතේ වූ පොල් ඉඩම් තුල සත්ත්ව පාලන ප්‍රවර්ධන වැඩසටහන යටතේ සම්පූර්ණ වශයෙන් සත්ත්ව පාලන ඒකක පහක් පිහිටුවීමට ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල කිසිදු සත්ත්ව පාලන ඒකකක් පිහිටුවා නොතිබුණි. එම වැඩසටහන සඳහා වෙන් කර තිබූ මුදල් භාවිතාකර ගව ගාල් සහනාධාරය යටතේ ඉලක්ක කල ගව ගාල් 660 න් ගාල් 75 ක් සඳහා රු මිලියන 1.9 ක සහනාධාර මුදලක් ලබාදී තිබුණි.

3.1.2 ආදර්ශ පොල් උයන්

2011 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ලෙස වතු 10 ක් සහ ආදර්ශ මධ්‍යස්ථාන වශයෙන් වතු 02 ක් මණ්ඩලය විසින් කළමනාකරණය කර තිබුණි. උක්ත පොල් උයන් සහ ආදර්ශ මධ්‍යස්ථාන වල පසුගිය වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේ පොල් ඵලදාව පිළිබඳ දත්ත කිහිපයක් පහත දැක්වේ.

| ආදර්ශ පොල් උයන/ ආදර්ශ මධ්‍යස්ථාන | වගා කර ඇති භූමි ප්‍රමාණය | එල දරන ගස් සංඛ්‍යාව | කඩන ලද පොල් | වැටුණු පොල් | වාර්ෂික අස්වැන්න ගෙඩි | වැටුණු පොල් ප්‍රතිශතය % | ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න | අක්කරයකට එලදාව ගෙඩි |
|---|---|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | 347 | 15,274 | 638,944 | 339,532 | 978,476 | 35 | 64 | 2,820 |
| රන්දෙණිය | 311 | 12,990 | 542,567 | 337,910 | 880,477 | 38 | 68 | 2,831 |
| ලේනව | 416 | 11,190 | 851,552 | 126,578 | 978,130 | 13 | 87 | 2,351 |
| බෝපිටිය | 104 | 4,754 | 206,905 | 120,939 | 327,844 | 37 | 69 | 3,152 |
| ගර්ට්ලන්ඩ් | 388 | 16,154 | 438,743 | 217,869 | 656,612 | 33 | 41 | 1,692 |
| කොරෙයි | 173 | 5,423 | 171,275 | 19,435 | 190,710 | 10 | 35 | 1,102 |
| පාසිකුඩා | 47 | 3,001 | 146,221 | 14,188 | 160,409 | 9 | 23 | 3,420 |
| මහයාය | 185 | 11,550 | 635,585 | 274,935 | 910,520 | 30 | 79 | 4,915 |
| ඩේසිවැලි | 299 | 14,308 | 556,612 | 332,396 | 889,008 | 37 | 62 | 2,975 |
| මුන්දලම | 14 | 710 | 53,742 | 8,142 | 61,884 | 13 | 87 | 4,343 |
| කොහොඹාන | 82 | 3,776 | 124,804 | 61,099 | 185,903 | 33 | 49 | 2,267 |
| පලෙයි | 81 | 4,548 | 100,230 | 10,381 | 110,611 | 9 | 24 | 1,366 |
| **එකතුව** | **2,447** | **103,678** | **4,467,180** | **1,863,404** | **6,330,584** | **29** | **61** | **2,587** |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

**(අ)** 2011 වර්ෂයේ මුළු පොල් එලදාව ගෙඩි මිලියන 6.33 ක් විය. එය ඉකුත් වර්ෂය හා සැසඳමේදී 6.7% ක වර්ධනයක් වුවත් 2009 වර්ෂයට සාපේක්ෂව 11% ක අඩුවීමකි.

**(ආ)** සාමාන්‍ය තත්වයන් යටතේ පොල් වගා බිම් අක්කරයකින් වාර්ෂිකව අවම වශයෙන් පොල් ගෙඩි 4500 -5000 අතර ප්‍රමාණයකින් පොල් එලදාවක් ලබා ගත හැකි වුවත් සමස්ථයක් ලෙස මණ්ඩලය සතු පොල්වතු වලින් මහයාය හා මුන්දලම හැර අනෙකුත් ආදර්ශ පොල් උයන් , එම සාමාන්‍ය මට්ටමවත් ලඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ඇ)** ආදර්ශ පොල් උයන් ලෙස නඩත්තුකරන පොල් වතු 12 න් පාසිකුඩා, පලෙයි, කොරෙයි, ගර්ඩ්ලන්ඩ් හා කොහොඹාන යන වතු වල ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 50 කට වඩා අඩුවෙන් පැවතුණි.

**(ඇ)** රන්දෙණිය, ඩේසිවැලි, බෝපිටිය, නාගන්සෝල, ගර්ට්ලන්ඩ්, කොහොඹාන හා මහයාය යන පොල් උයන් වල වැටුණු පොල් ප්‍රතිශතය 30% ත් 38% ත් අතර ඉතා ඉහල අගයක් ගෙන තිබූ බැවින් එලදාව නෙලීම නිසි කලට සිදුවී නොතිබුණි.

### 3.1.3 මීගමුවේ බීජ පොල් ඒකකය

මණ්ඩලය පොල් වගාව සංවර්ධනය කිරීමේ අරමුණින් 2011 වර්ෂයේදි පොල් පැල මිලියන 04ක් නිෂ්පාදනය කර අක්කර 61,538 ක පොල් වගා බිම් සංවර්ධනය කිරීම ඉලක්ක කර තිබුණි. පොල් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය බීජ පොල් සැපයීමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදි පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රටේ වගා කටයුතු සඳහා සුදුසු බීජ පොල් සැපයීම් කාර්ය වෙනුවෙන් මණ්ඩලය සතුව මීගමුවේ බීජ පොල් ඒකකය ස්ථාපිත කර තිබුණි. රටේ වාර්ෂික බීජ පොල් අවශ්‍යතාවය හඳුනාගෙන එය ලබාගැනීමට ප්‍රමාණවත් මව් ගස් හා සරු ගස් සංචිතයක් පවත්වා ගැනීම මෙහි මුඛ්‍ය කාර්ය වුවත් 2008 වර්ෂයෙන් පසු මව් ගස් හා සරු ගස් සංචිතය වැඩි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එහෙයින් 2011 වර්ෂයේ පොල් පැල මිලියන 04 ක් නිෂ්පාදනය කිරීමේ වැඩසටහනේ දි ර්ට අවශ්‍ය බීජ වලින්, බීජ පොල් 3,152,728 ක ප්‍රමාණය මව් ගස් හෝ සරු ගස් වලින් තෝරා ගෙන නොතිබුණි.

### 3.1.4 කප්රුක ණය ආයෝජන ක්‍රමය

ගොවිපළ සංවර්ධනය මත පදනම් වූ වාණිජ කෘෂිකර්මාන්තය පොල් වගා අශ්‍රිතව දිරිගැන්වීම තුලින් පොල් වගා ක්ෂේත්‍රය යැපුම් මට්ටමෙන් වාණිජ තත්වයට පත්කිරීම හා එමගින් පොල්වගාවේ පැවැත්ම සංවර්ධනය හා එහි ආර්ථික දායකත්වය ඉහල නැංවීම මෙම ණය ආයෝජන ක්‍රමයේ දිගුකාලීන අරමුණ විය. වර්තමානයේදි එක් වගාකරුවකුට අක්කරයකට රු 75,000 බැගින් ලබාදෙන උපරිම ණය මුදල රු.1,000,000 කට සීමාවීමෙන් අක්කර 13 ට වඩා වැඩි ඉඩම් හිමි වගාකරුවන් 28,198 දෙනෙකුට මෙම යෝජනා ක්‍රමයට ඇතුලත් වීමේ අවස්ථාව අහිමි වීම මත ඉහත කී අරමුණ කරා මණ්ඩලයට ලගාවීමට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත් 2011 නොවැම්බර් 25 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි ඉහත උපරිම ණය සීමාව රු. මිලියන 2 දක්වා වැඩි කර තිබුණි.

### 3.1.5 පොල් සංවර්ධන පුහුණු වැඩ සටහන

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මගින් පොල් වගාකරුවන්ට සහ මණ්ඩලයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට ඵලදායි පුහුණුවක් සැපයීම අරමුණු කරගෙන, සමාලොචිත වර්ෂයේ දි සැලසුම් කොට ක්‍රියාත්මක කර තිබූ පුහුණු වැඩසටහන් 63 කින් පුහුණු මධ්‍යස්ථානය තුල පවත්වන ලද වැඩසටහන් 10 ක කිසිදු කාර්ය සාධනයක් පෙන්නුම් නොකෙරණි.

(ආ) මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය කාර්යාල මඟින් ක්‍රියාත්මක කර තිබූ දැනුවත් කිරීමේ වැඩ සටහන් 3 ක ප්‍රගතිය 44% කට වඩා අඩු මට්ටමක පැවතුණි. සැලසුම් කළ පුහුණු වැඩසටහන් මණ්ඩලයේ අවශ්‍යතාව හා අමාත්‍යාංශ ප්‍රතිපත්ති මත වෙනස් විය හැකි බව සභාපතිවරයා දන්වා තිබුණි.

3.2 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

ගිවිසුම් ප්‍රකාරව කප්රුක ණය ආයෝජන ක්‍රමය සඳහා රු. ලක්ෂ 8 ක් වටිනා මොඩියුල 6 කින් යුත් පරිඝණක පැකේජය නිර්මාණය කොට එහි කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිම කළ යුතුව තිබුණත් නිමවී තිබුණේ ඉන් මොඩියුල 3ක් පමණි. මේ සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. ලක්ෂ 4 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි.

3.3 <u>වෙනත් ආයතනයන්ට සපයා ඇති සම්පත්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති පීඊඩී අංක 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයට පටහැනිව මණ්ඩලය සතු සේවකයන් 05 දෙනෙකු රේඛීය අමාත්‍යාංශ සේවයේ යොදවා තිබූ අතර ඔවුන්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු. 1,540,500 ක දරා තිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ අංක 8.3.9 ඡේදයට පටහැනිව මණ්ඩලය සතු වාහන 2 ක් රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර ඒ සඳහා මණඩලය රු.355,636 ක වියදමක් දරා තිබුණි.

3.4. <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 22 | 26 |
| තෘතියික මට්ටම | 84 | 50 | 34 |
| ද්විතියික මට්ටම | 476 | 332 | 144 |
| ප්‍රාථමික මට්ටම | 151 | 121 | 30 |
| | 759 | 525 | 234 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මණ්ඩලය සතුව අනුමත වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් නොතිබුණි.

(ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාල වන තනතුරු 234 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

4. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ). ගිණුම්කරණය

(ආ). මානව සම්පත්

(ඇ). වාහන උපයෝජනය

(ඈ). සහනාධාර

(ඉ). බීජ පොල්

(ඊ). පුහුණු වැඩ සටහන